දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784807, 2784832, 2785 617

ලේකම් / செயலாளர் / Secretary } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊ මේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. }

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல.
Isurupaya", Sri Jayawardhanapura Kotte.
Battaramulla.

මගේ අංකය / எமது இல / My No. } ED/5/79/01/04

දිනය / திகதி / Date } 2017.05. 26


**චක්‍රලේඛ අංක - 2017/20**

සියළුම අතිරේක ලේකම්වරුන් ,
සියළුම ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් ,
සියළුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,

<u>අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වැඩමුළු / පුහුණු සැසි / සම්මන්ත්‍රණ සඳහා ගෙවීම් කිරීම.</u>

උක්ත කාරණය සම්බන්ධව නිකුත් කරන ලද 2010/31 දරණ 2010.10.11 දිනැති චක්‍රලේඛයෙහි අංක 03 වගන්තිය පහත පරිදි සංශෝධනය කරමි.

02.වැඩමුළු / පුහුණු සැසි / සම්මන්ත්‍රණ ආදිය සඳහා සහභාගීත්ව දීමනා ගෙවීමේ දී පමණක් අවම වශයෙන් සහභාගීත්වය 75% ක් වන සීමාව අදාළ නොකර ගත යුතු බව දන්වමි.එවැනි අවස්ථාවල දී කල්වේලා ඇතිව එම නිලධාරීන්ගෙන් සහභාගී නොවීමට අදාළ සාධාරණ හේතු ලිඛිතව ලබා ගත යුතුය. එසේ නොවන අවස්ථාවලදී සහභාගීත්ව දීමනා හැර වැඩමුළුවේ සමස්ථ ඒකක පිරිවැය සහභාගී නොවන නිලධාරීන්ගේ වැටුපෙන් අය කර ගැනීමේ වගකීම අදාළ විෂය භාර අධ්‍යක්ෂවරයා වෙත පැවරෙනු ඇත

03.වැඩසටහන් සැලසුම් කිරීමේදී අදාළ අධ්‍යක්ෂවරුන් විසින් කල්වේලා ඇතිව සහභාගීත්වය තහවුරු කර ගැනීම සිදු කර ගත යුතු බවත් දන්වමි.

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්